# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1984 අංක 36 දරන ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1984 අගෝස්තු මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1984 අගෝස්තු මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ ශත : 60 යි

තැපැල් ගාස්තුව ශත : 60 යි

# 1984 අංක 36 දරන ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1984 අගෝස්තු මස 24 වන දින.]

එල්. ඩී.—ඕ. 82/84

**1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

කෙටි නාමය.

1. මේ පනත 1984 අංක 36 දරන ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

381 වන අධිකාරයේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 28 වන වගන්තියේ (5) වන උපවගන්තියෙහි "නාම යෝජනා දිනයෙහි පස්වරු එක" යන යෙදුම වෙනුවට "නාම යෝජනා දිනයෙහි පෙරවරු එකොළහ" යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 28අ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 28අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"මැතිවරණ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂ.

28අ. (1) මැතිවරණයක් පැවැත්වීමට නියම කරන දැන්වීමේ දිනයට පෙරාතුවම වූ දිනයෙහි, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ පිළිගත් දේශපාලන පක්ෂයක් වශයෙන් සලකනු ලැබීමට හිමිකම් ලැබ තිබූ දේශපාලන පක්ෂයක්, මේ පනතේ සෙසු විධිවිධානවලට යටත්ව, මේ ආඥාව යටතේ මැතිවරණ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් වශයෙන් සලකනු ලැබීමට හිමිකම් ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීම ප්‍රකාර, දේශපාලන පක්ෂයක් මැතිවරණ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් වශයෙන් සලකනු ලැබීමට හිමිකම් ලබා ඇති අවස්ථාවක, එම පක්ෂයට 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ වෙන් කරනු ලැබූ අනුමත කරන ලද ලකුණ, 28ආ වගන්තියේ විධිවිධානවලට යටත් ව, මේ ආඥාව යටතේ එම පක්ෂයට වෙන් කරනු ලැබූ අනුමත කරන ලද ලකුණ වශයෙන් සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි, "නාම යෝජනා දිනයෙහි පස්වරු එක" යන යෙදුම වෙනුවට "නාම යෝජනා දිනයෙහි පෙරවරු එකොළහ" යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ඒ 073479—1,275 (54/08)

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 34අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 34අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:—

" කිසිම අපේක්ෂකයකු නාමයෝජනා කරනු ලැබ නොමැති විට අලුත් නාම යෝජනා දිනයක් නියම කළ යුතු බව.

34අ. නාම යෝජනා දිනයෙහි කිසියම් මැතිවරණ කොට්ඨාසයක් සම්බන්ධයෙන්—

(අ) එදින පෙරවරුවේ එකොළහ වන විට තේරීම්භාර නිලධරයා වෙත කිසිම නාම යෝජනා පත්‍රයක් ලැබී නොතිබීමේ; හෝ

(ආ) එදින පෙරවරුවේ එකොළහ වන විට තේරීම්භාර නිලධරයා වෙත ලැබුණු සියලුම නාම යෝජනා පත්‍ර ඔහු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ තිබීමේ හෝ

හේතුවෙන් කිසිම අපේක්ෂකයකු නාම යෝජනා කරනු ලැබ නොසිටි නම්, තේරීම්භාර නිලධරයා විසින් ඒ බව වහාම කොමසාරිස්වරයා වෙත දැනුම් දිය යුතු අතර, එම මැතිවරණය අලුතින්ම පැවැත්වීමට අදාළ සියලු කටයුතු ඒ කොමසාරිස්වරයා විසින් ආරම්භ කරනු ලැබිය යුතු ය, නැතහොත් එසේ ආරම්භ කිරීමට සැලැස්විය යුතු ය. එසේ වුවද ඒ මැතිවරණය සඳහා නියම කරනු ලැබිය යුතු නාම යෝජනා දිනය ඒ මැතිවරණය සඳහා නිශ්චය කරන ලද අන්තිම නාමයෝජනා දිනයේ සිට දින තිහකට පූර්වයෙන් නොවූද දින හැටකට පසුව නොවූද දිනයක් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(3) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින්, කොමසාරිස්වරයා විසින් වෙනත් යම් වේලාවක් නියම කරනු ලැබුවහොත් මිස, යම් ඡන්ද කොට්ඨාසයක ඡන්ද විමසීම, 35 වන වගන්තිය යටතේ නියම කරන ලද දිනයේ පෙරවරු හතට ආරම්භ කරනු ලැබිය යුතු අතර, එදින පස්වරු හතරට අවසන් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 47අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 47අ වගන්තිය ලෙස බල පැවැත්විය යුතුය:—

" ඡන්ද පොළවල් වල බාධා සිදුවීම.

47අ. (1) එවැනි ස්වභාවයේ සිද්ධියක් හේතු වෙන්—

(අ) ඡන්ද විමසීම ආරම්භ කිරීම සඳහා නියම කර ඇති වේලාවේ දී යම් ඡන්ද පොළක ඡන්ද විමසීම ආරම්භ කිරීමට නොහැකි වන්නා වූ; හෝ

(ආ) ඡන්ද විමසීම සඳහා නියම කර ඇති වේලාවේ දී ඡන්ද පොළෙහි ඡන්ද විමසීම ආරම්භ වන නමුත් ඡන්ද විමසීම අවසන් කිරීමට නියමිත වේලාව තෙක් එම ඡන්ද විමසීම පවත්වා ගෙන යාමට නොහැකි වන්නා වූ; හෝ

(ඇ) ඡන්ද පොළට වෙන් කර දී ඇති ඡන්ද පෙට්ටි අතුරින් යම් ඡන්ද පෙට්ටියක් තෝරීම්භාර නිලධරයා වෙත බාර දීමට නොහැකි වන්නා වූ

අවස්ථාවක, එම ඡන්ද පොළෙහි ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඒ බව වහාම තෝරීම්භාර නිලධරයා වෙත දැන්විය යුතු අතර තෝරීම්භාර නිලධරයා විසින් ඒ බව කොමසාරිස්වරයා වෙත දන්වනු ලැබිය යුතු ය.

(2) ඡන්ද කොට්ඨාසයක ඡන්ද පොළකට අදාළව (1) වන උපවගන්තිය යටතේ තොරතුරක් ලැබුණ විට කොමසාරිස්වරයා විසින්, එම ඡන්ද පොළෙහි දෙනු ලැබූ ඡන්ද හෝ දෙනු ලැබිය හැකිව තිබූ ඡන්ද හෝ ගණන් කිරීමට අපොහොසත් වීම, ඒ ඡන්ද කොට්ඨාසය සඳහා ඡන්ද විමසීමේ ප්‍රතිඵල කෙරෙහි බලපෑමට හේතු විය හැකි බව ඔහුගේ මතය වේ නම්, ඒ ඡන්ද පොළෙහි ඡන්ද විමසීම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් බලරහිත යයි ප්‍රකාශ කරනු ලැබිය හැකි අතර, එම ඡන්ද පොළෙහි අලුතෙන් ඡන්දය ගැනීම සඳහා දිනයක් නියම කරනු ලැබිය යුතු ය. එසේ නියම කරනු ලබන දිනය ඒ ඡන්ද පොළ සම්බන්ධයෙන් ඔහු වෙත තොරතුරු ලැබුණ දිනයේ සිට සති දෙකකට පෙරාතුව සහ සති හතරකට පසුව යෙදෙන දිනයක් නොවිය යුතු ය. ඡන්ද විමසීමේ අලුත් දිනය පිළිබඳව එක් එක් ජාතික භාෂාවෙන් වූ යටත් පිරිසෙයින් එක් පුවත්පතක සහ එම ඡන්ද කොට්ඨාසය ඇතුළත ප්‍රකටව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් මගින් කොමසාරිස්වරයා විසින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ නියමයක් ප්‍රකාර පවත්වනු ලබන ඡන්ද විමසීමක දී ඡන්දය දීම සහ ඡන්දය ගණන් කිරීම පිළිබඳව සහ ඊට අදාළව 36 වන, 37 වන, 39 වන, 40 වන, 41 වන, 42 වන, 43 වන, 43අ වන, 44 වන, 45 වන, 46 වන, 47 වන සහ 48 වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය. ඒ ඡන්ද විමසීමේ දී ප්‍රයෝජනයට ගන්නා

ඡන්ද හිමි නාම ලේඛනය, ඊට පූර්වයෙන් පවත්වන ලද ඡන්ද විමසීමේ දී ප්‍රයෝජනයට ගන්නා ලද ඡන්ද හිමි නාම ලේඛනයම විය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් ප්‍රකාර පවත්වන ලද ඡන්ද විමසීමක දී 52අඅ, 52ආ සහ 56(2) වන වගන්තිවල විධිවිධාන අදාළ කිරීමේ කාර්ය සඳහා, ඒ වගන්තිවල යෙදෙන "එම මැතිවරණයේ දී ඡන්ද විමසීම පවත්වන ලද දිනයට පසු දින" යන යෙදුම එම ඡන්ද විමසීම සඳහා ඒ නියමය මගින් නියම කරන ලද දිනයට පසු දිනය සම්බන්ධයෙන් වූ සඳහන් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) (2) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් ප්‍රකාර පවත්වන ලද ඡන්ද විමසීමක දී ඡන්දය දීමේ හේතුවෙන් මැතිවරණයක දී එක් වරකට වඩා ඡන්දය දෙන යම් තැනැත්තකු, මේ නියමය යටතේ යම් වරදක් සඳහා වරදකරු වකු නොවන්නේ යයි සලකනු ලැබිය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 48අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.**

8. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 48 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය, ඒ ප්‍රඥප්තියේ 48අ වගන්තිය ලෙස බල පැවැත්විය යුතු ය :—

**"ඡන්ද විමසීමට බාධා වූ මැතිවරණයක ඡන්ද ගණන් කිරීම.**

48අ. (1) ඡන්ද කොට්ඨාසයක ඡන්ද පොළක් සම්බන්ධයෙන් තොරතුරක් 47අ(1) වන වගන්තිය යටතේ කොමසාරිස්වරයා වෙත ලැබී ඇති අවස්ථාවක එම තොරතුරු ලැබුණේ යම් ඡන්ද පොළක් සම්බන්ධයෙන් ද ඒ ඡන්ද පොළෙහි ඡන්ද පෙට්ටි හැර, ඒ ඡන්ද කොට්ඨාසයට අදාළ සියලුම ඡන්ද පෙට්ටි තේරීම්භාර නිලධරයා වෙත ලැබුණු පසුව ඒ ඡන්ද කොට්ඨාසය සඳහා මැතිවරණයේ ඡන්ද ගණන් කිරීම ආරම්භ කළ යුතු ය. තේරීම්භාර නිලධරයා වෙත ලැබුණු ඡන්ද පෙට්ටිවල ඡන්ද ගණන් කිරීම සම්බන්ධයෙන්, මැතිවරණයක දී ඡන්ද ගණන් කිරීමට අදාළ වූ මේ ආඥාවේ විධිවිධාන අදාළ විය යුතු ය. තේරීම්භාර නිලධරයා විසින් ඡන්ද පෙට්ටිවල ඡන්ද ගණන් කොට එක් එක් අපේක්ෂකයා විසින් ලබා ගන්නා ලද ඡන්ද සංඛ්‍යාව වාර්තා ගත කළ යුතු ය.

(2) ඡන්දය ගණන් කිරීම අදාළ වන්නා වූ ඡන්ද කොට්ඨාසයක යම් ඡන්ද පොළක් සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින් 47අ(2) වන වගන්තිය යටතේ කිසිදු නියමයක් නොකරනු ලැබේ නම් (1) වන උපවගන්තියට අනුකූලව කරන ලද ඡන්ද

ගණන් කිරීමේ දී වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත් අපේක්ෂකයා තෝරී පත්වී ඇති බව ප්‍රකාශ කරන ලෙස කොමසාරිස්වරයා විසින් තෝරීම්භාර නිලධරයාට විධාන කළ යුතු ය.

(3) ඡන්ද ගණන් කිරීම අදාළ වන්නා වූ මැතිවරණ කොට්ඨාසයක යම් ඡන්ද පොළක් සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින්, 47අ(2) වන වගන්තිය යටතේ නියමයක් කරනු ලැබුවහොත්, තෝරීම්භාර නිලධරයා විසින් (1) වන උපවගන්තියට අනුකූලව කරන ලද ඡන්ද ගණන් කිරීමේ දී එක් එක් අපේක්ෂකයා විසින් ලබාගන්නා ලද ඡන්ද සංඛ්‍යාව 47අ(2) වගන්තිය යටතේ වූ නියමය ප්‍රකාර පවත්වන ලද ඡන්ද විමසීමේ දී ඒ අපේක්ෂකයා විසින් ලබා ගන්නා ලද ඡන්ද සංඛ්‍යාවට එකතු කරනු ලැබිය යුතු අතර එසේ එකතු කිරීමෙන් පසුව වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයා තෝරී පත්වී ඇති ලෙස ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.”.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.